# ECONOMIC GROWTH
# &
# DEVELOPMENT
# (Part-VI)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of Sri Jayewardenepura***

# නිරපේක්ෂ දරිද්‍රතාව

ශ්‍රී ලංකාවේ නිරපේක්ෂ දරිද්‍රතාව මනිනු ලබන්නේ පරිභෝජන දරිද්‍රතාව පදනම් කර ගෙන යි.

මෙය ගණනය කිරීම සඳහා අවශ්‍ය ආදායම් හා වියදම් දත්ත සපයා ගනු ලබන්නේ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් වසර තුනකට වරක් පවත්වනු ලබන කුටුම්භ ආදායම් වියදම් සමීක්ෂණය මගිනි.

ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන අයුරින් මෑත කාලීන ව මෙම සමීක්ෂණය පවත්වා ඇත්තේ 2012/2013 වර්ෂයේ දී ය.

මෙම සමීක්ෂණයට අනුව 2009/10 වර්ෂයේ දී 8.9% ක් වූ ජාතික දරිද්‍රතා අනුපාතිකය 2012/13 වර්ෂයේ දී 6.7% දක්වා අඩු වී ඇත.

ClassWork LK

ශ්‍රී ලංකාවේ ජනගහන දරිද්‍රතා දර්ශකය අනුව දිස්ත්‍රික්ක මට්ටමින් අඩු ම දරිද්‍රතා අනුපාතිකය 1.4% ක් ලෙස කොළඹ දිස්ත්‍රික්කයේ වාර්තා කරන අතර වැඩි ම දරිද්‍රතා අනුපාතිකය වන 28.8% මුලතිව් දිස්ත්‍රික්කය වාර්තා කර ඇත.

පළාත් වශයෙන් ගත් විට අඩු ම දරිද්‍රතා අනුපාතිකය වන 2.0% බස්නාහිර පළාත් වාර්තා කරන අතර, ඉහළ ම දරිද්‍රතා අනපුාතය වන 15.4% ඌව පළාතෙන් වාර්තා වේ.

සමස්තයක් ලෙස ගත් විට ශ්‍රී ලංකාවේ 2012/13 වර්ෂයේ නාගරික අංශයේ දරිද්‍රතා අනුපාතිකය 2.1% ක් ද ග්‍රාමීය අංශයේ දරිද්‍රතා අනුපාතිකය 7.6% ක් ද වතු අංශයේ දරිද්‍රතා අනුපාතිකය 10.9% ක් ද වේ.

ClassWork.LK

# ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවේ ප්‍රාදේශීය වෙනස්කම්

ඉහත සඳහන් ආකාරයට ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවේ ප්‍රාදේශීය වෙනස්කම් ඇති වීම කෙරෙහි බලපාන හේතු පහත දැක්වේ.

- ආර්ථික වර්ධනය පහළ මට්ටමක පැවතීම
- ජන සංඛ්‍යාව වේගයෙන් වර්ධනය වීම
- ස්වාභාවික විපත්
- යටිතල පහසුකම් දුර්වල වීම
- අයහපත් රාජ්‍ය පාලනය
- අධ්‍යාපන, සෞඛ්‍ය සේවා දුර්වල වීම
- වෙළෙඳපොළට පිවිසීමේ බාධා
- කුටුම්බවල විශාලත්වය
- පෝෂණ මට්ටම්වල විෂමතා
- සංස්කෘතික බලපෑම්
- අභ්‍යන්තර ගැටුම්

ClassWork.LK

# දරිද්‍රතාව කෙරෙහි බලපාන සාදක

ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව කෙරෙහි පහත සඳහන් සාධක බලපායි.

### ප්‍රාදේශීය සාධක

- නගර හා වෙළෙඳපොළ අතර සබඳතාව දුරස් වීම
- යුද ගැටුම් හා වාර්ෂික අරගල
- කෘෂි කර්මාන්තය ප්‍රධාන රැකියා මූලාශ්‍රයයක් වීම

### ආංශික සාධක

- අධ්‍යාපනයේ ගුණාත්මක බව පහළ මට්ටමක පැවතීම
- කෘෂි කර්මාන්තයේ ඵලදායිතාව පහළ අගයක් ගැනීම

### කුටුම්බ සාධක

- පවුලේ වැඩි දරුවන් සංඛ්‍යාවක් සිටීම
- අඩු අධ්‍යාපන මට්ටම
- උරුමයෙන් ලත් වත්කම් අඩු වීම
- මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වීම

ClassWork LK

# ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග

ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව අවම කිරීමට ගත හැකි ක්‍රියා මාර්ග පහත දැක්වේ.

- දිළිඳු ජන කොටස්වල ජීවන තත්ත්වය උසස් කිරීමට ඇති අවස්ථා පුළුල් කිරීම
  - රැකියා අවස්ථා බහුල කිරීම
  - සෞඛ්‍ය පහසුකම් සැපයීම
  - යටිතල පහසුකම් සැපයීම
  - කුඩා පරිමාණයේ ව්‍යාපාර ශක්තිමත් කිරීම
  - විවිධ ශුභසාධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම

- තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගි වන ජන කොටස් සවිබල ගැන්වීම
  - රාජ්‍ය පරිපාලනය පහසු කිරීම
  - නෛතික ක්‍රියාමාර්ග සඳහා ප්‍රවේශ වීමට ඇති හැකියාව පුළුල් කිරීම
  - තොරතුරු ලබා ගැනීමේ හැකියාව පුළුල් කිරීම

ClassWork.LK

- අනාරක්ෂිත තත්ත්වයෙන් ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය රැකවරණ ලබා දීම
  - බෝවන රෝග පාලනය
  - රක්ෂණ ආවරණ ලබා දීම
  - සහනාධාර සැපයීම

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura